ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ගුරු අධ්‍යාපනඥයින් සඳහා වන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව

ESP 1263 /2253- විෂයමාලාව හා ඉගෙනුම ඇගයීම

අවසාන පරීක්ෂණය 2010

කාලය - පැය තුනයි.

දිනය - 2010 ජූලි 03 වේලාව - පෙ.ව.09.30 - ප.ව. 12.30

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.
සෑම පිළිතුරක් සඳහාම වෙනම පොතක් භාවිත කරන්න.

01. i. ශ්‍රී ලංකාවේ වර්තමාන ප්‍රාථමික හෝ ද්විතියික පාසල් විෂයමාලා අතුරින් එකක් තෝරාගෙන ඒ පිළිබඳ කරුණු ගෙන හැර දක්වන්න. (ලකුණු 08)

ii. ඔබ විසින් ඉහතින් සඳහන් කරන ලද විෂයමාලාව සංවර්ධනය සඳහා බලපෑම් කළහැකි විෂයමාලා ආකෘතියක් නම් කර සුදුසු නිදසුන් සහිතව එම ආකෘතියේ ප්‍රධාන අංග විස්තර කරන්න. (ලකුණු 15)

iii. ඔබ විසින් තෝරාගත් විෂයමාලාව සඳහා මෙම අංග සම්බන්ධ කළහැකි ආකාරය නිදසුන් මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

02. i. විෂයමාලා සංවිධානය යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද යන්න විස්තර කරන්න. විෂයමාලා සංවිධානයේදී ගැටළු මතුවිය හැකි ක්ෂේත්‍ර තුනක් (03) දක්වන්න. (ලකුණු 08)

ii. විෂයමාලා සංවිධානයේදී මතුවන ඉහත ගැටලු විසඳීමට හෝ මඟහරවා ගැනීමට අනුගමනය කළහැකි මූලධර්ම මොනවාද ? (ලකුණු 10)

iii. ඔබට සමීප පාසල් විෂයමාලාවක් නම්කර මෙම විෂයමාලා සංවිධානයේ ප්‍රබලතා හා දුබලතා දක්වන්න. මෙම ප්‍රබලතා හා දුබලතාවලට හේතු දෙන්න (ලකුණු 15)

03. i. විෂයමාලා වෙනස්වීම් කළමනාකරණය සංකල්පය විස්තර කරන්න. (ලකුණු 04)

ii. විෂයමාලා නවීකරණ වෙනස්කම් කාරකයන්ගේ භූමිකා හා ක්‍රියාකාරීත්වයන් හඳුනා ගන්න. (ලකුණු 06)

iii. වෙනස් වූ විෂයමාලාවන් ක්‍රියාවට නැංවීමේදී වෙනස්වීම් කාරකයෙක් ලෙස ගුරුවරයා මුහුණ දෙන බාධක සාකච්ඡා කරන්න. (ලකුණු 13)

iv. මෙම බාධාවන් මඟහරවා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග විස්තර කරන්න. (ලකුණු 10)

04. i. පරීක්ෂණයක "ප්‍රායෝගිකත්වය" යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ලකුණු 05)

ii. ශිෂ්‍ය සාධනය පරීක්ෂා කළහැකි ප්‍රශ්න පත්‍රයක ඇති වලංගුතාව අඩුවීමේ ගැටලුව නිදසුන් මගින් විග්‍රහ කරන්න.

(ලකුණු 13)

iii. පංති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය දියුණු කිරීමට පරීක්ෂණ යොදාගත හැකි ආකාරය විස්තර කරන්න.

(ලකුණු 15)

05. i. විෂයමාලා ඇගයීම යනු කුමක්දැයි විස්තර කර, විෂයමාලාව ඇගයීමේ අවශ්‍යතාව දක්වන්න.

(ලකුණු 08)

ii. විෂයමාලාව ඇගයීමේ ප්‍රධාන අපේක්ෂණ මොනවාද?

(ලකුණු 08)

iii. ඔබ දන්නා ඕනෑම විෂයමාලා ඇගයීමේ ආකෘතියක් දක්වා, එම ආකෘතියේදී යොදාගත හැකි ක්‍රියාකාරකම්/ක්‍රියාවලින් විග්‍රහ කරන්න.

(ලකුණු 08)

iv. ශ්‍රී ලංකාවේ ඕනෑම ගුරු අධ්‍යාපන පාඨමාලාවක් හඳුනා ගෙන මෙම ආකෘතිය එය ඇගයීමට ඇති යෝග්‍යතාව පරීක්ෂා කරන්න.

(ලකුණු 09)

06. පහත සඳහන් මාතෘකා අතුරින් ඕනෑම තුනකට (03) කෙටි සටහන් ලියන්න.

i. සම්භවන, සම්පිණ්ඩිත හා ස්ථානගත කිරීමේ ඇගයීම.
ii. ශිෂ්‍ය සාධනය තක්සේරුකරණය
iii. ගුරු කාර්ය සාධනය ඇගයීම
iv. ශිෂ්‍ය පරීක්ෂණ ප්‍රතිඵල විශ්ලේෂණය හා වාර්තා කිරීම
v. ගුරු අධ්‍යාපනඥයන්ගේ අධීක්ෂණ භූමිකාව

(ලකුණු 11 x3 )

\- හිමිකම් ඇවිරිණි. -